# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය)

සමාගමක් සිය මූල්‍ය ප්‍රකාශ සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ද පිළියෙළ කළ යුතු ය. වාර්තාකරණ කාලච්ඡේදයේ ව්‍යාපාරයේ හිමිකමේ සිදුවී ඇති වෙනස්වීම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළින් නිරූපණය කෙරේ.

**හිමිකම වෙනස්වීමේ ප්‍රකාශයෙහි මුහුණත හෝ සටහන් වල පහත කරුණු අනාවරණය කළ යුතු ය.**

අ) ස්කන්ධ හිමියන්ට (කොටස් හිමියන්ට) කරන බෙදාහැරීම් , ස්කන්ධ හිමිකාරිත්වයේ පිහිටා සිදුකරන ගණුදෙණු වල වටිනාකම්.

උදා : නව කොටස් නිකුතුව, සංචිත ප්‍රාග්ධනිත කිරීම, හිමිකම් නිකුතුව.

ආ) රඳවාගත් ලාභයේ සංචලනයන්

උදා : පොදු සංචිතයට මාරු කිරීම.

ඇ) කාලච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ

## අභ්‍යාස 01

සීමිත සුමග පොදු සමාගමේ 2019.04.01 දිනට හිමිකම් අයිතම පහත දැක්වේ.

| | | රු. '000 |
|---|---|---|
| (i) | රු. 20 සාමාන්‍ය කොටස් (1,000,000) | 20,000 |
| | ප්‍රත්‍යාගණන සංචිත (ඉඩම්) | 5,000 |
| | පොදු සංචිත | 8,000 |
| | රඳවාගත් ඉපයුම් | 4,500 |

(ii) සීමිත සුමග පොදු සමාගමේ 2020.03.31 දිනට ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු.

| | රු. '000 |
|---|---|
| කාලච්ඡේදයෙන් ශුද්ධ ලාභය (බදු පසු) | 8,500 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 3,000 |
| මුළු විස්තරණ ආදායම් | 11,500 |

(iii) සීමිත සුමග පොදු සමාගමේ 2020.03.31 අවසන් වසර තුළ හිමිකම් වෙනස්වීමට ඉවහල් වූ ගණුදෙණු පහත දැක්වේ.

අ) 2019.05.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් එදිනට තිබූ සෑම සාමාන්‍ය කොටස් 5 : 1 බැගින් රු. 20 ප්‍රතිෂ්ඨාවකට සංචිත ප්‍රාග්ධනීකරණය සිදු කරයි. මේ සඳහා පොදු සංචිතය උපයෝගී කර ගනී.

ආ) 2019.07.01 දින රු. 10 බැගින්, 2019.04.01 දින පැවති සෑම සාමාන්‍ය කොටස් 4 : 1 බැගින් හිමිකම් නිකුතුවක් සිදු කිරීම.

ඉ) 2020.01.01 දින රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 50,000 ක් මහජනයාට නිකුත් කිරීම.

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්දන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

(iv) 2020.03.31 දින අධ්‍යක්ෂ මණ්ඩලය පහත තීරණ ගෙන ඇත.

අ) වසරේ ලාභයෙන් රු. 500,000 ක් පොදු සංචිතයට මාරු කිරීම.

ආ) සාමාන්‍ය කොටස් හිමිකම් සඳහා 400,000 ක අවසන් ලාභාංශයක් යෝජනා කර ඇත. කෙසේ වුව ද වසර තුළ සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 200,000 ක ලාභාංශයක් ගෙවා ඇත.

**අවශ්‍ය වන්නේ,**

1) සීමිත සුමග පොදු සමාගමේ 2020.03.31 අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය.

2) ඉහත සිද්ධීන් වාර්තා කිරීමට අවශ්‍ය ජ'නල් සටහන සහ ලෙජර් ගිණුම්.

**පිළිතුරු**

(i)

**සීමිත සුමඟ පොදු සමාගමේ**
**2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

(රු. '000)

| | සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිත | පොදු සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 20,000 | 5,000 | 8,000 | 4,500 | 37,500 |
| මුළු විස්තීරණ ආදායම් | | 3,000 | | 8,500 | 11,500 |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම් | 4,000 | | (4,000) | | - |
| හිමිකම් නිකුතුව | 2,500 | | | | 2,500 |
| කොටස් නිකුත් කිරීම | 1,000 | | | | 1,000 |
| පොදු සංචිතයට මාරු කිරීම | | | 500 | (500) | - |
| ගෙවූ ලාභාංශ - සාමාන්‍ය කොටස් | | | | (200) | (200) |
| යෝජිත ලාභාංශ - සාමා. කොටස් | | | | (සටහන) | |
| | 27,500 | 8,000 | 4,500 | 12,300 | 52,300 |

සටහන : සාමාන්‍ය කොටස් සඳහා රු. 400,000 ලාභාංශ යෝජනා කර ඇත.

(රු. '000)

**සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය**

| | | | |
|---|---|---|---|
| ශේ/ප/ගෙ | 27,500 | ඉ/ගෙ/ශේ | 20,000 |
| | | පොදු සංචිත | 4,000 |
| | | මුදල් | 2,500 |
| | | මුදල් | 1,000 |
| | 27,500 | | 27,500 |
| | | ශේ/ඉ/ගෙ | 27,500 |

**ප්‍රත්‍යාගණන සංචිත**

| | | | |
|---|---|---|---|
| ශේ/ප/ගෙ | 8,000 | ශේ/ඉ/ගෙ | 5,000 |
| | | ඉඩම් | 3,000 |
| | 8,000 | | 8,000 |
| | | ශේ/ඉ/ගෙ | 8,000 |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**පොදු සංචිත**

| | | | |
|---|---|---|---|
| සා.කො.ප්‍රා | 4,000 | ශේ/ඉ/ගෙ | 8,000 |
| ශේ/ප/ගෙ | 4,500 | රඳවාගත් ඉපයුම් | 500 |
| | 8,500 | | 8,500 |
| | | ශේ/ඉ/ගෙ | 4,500 |

**රඳවාගත් ඉපයුම්**

| | | | |
|---|---|---|---|
| ශේ/ප/ගෙ | 500 | ශේ/ඉ/ගෙ | 4,500 |
| මුදල් | 200 | ලා/ලා | 8,500 |
| ශේ/ප/ගෙ | 12,300 | | |
| | 13,000 | | 13,000 |
| | | ශේ/ඉ/ගෙ | 12,300 |

<u>ජ'නල් සටහන්</u>

**පොදු ජ'නලය** ('000)

| | | හර | බැර |
|---|---|---|---|
| (ii) | ලා/ලා ගිණුම (හර)<br>රඳවාගත් ඉපයුම්<br>(කාලච්ඡේදයේ ලාභය මාරු කිරීම) | 8,500 | 8,500 |
| | ඉඩම් ගිණුම (හර)<br>ප්‍රත්‍යාගණන සංචිත ගිණුම<br>(ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය සටහන් කිරීම) | 3,000 | 3,000 |
| (iii) අ) | පොදු සංචිත ගිණුම (හර)<br>සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගිණුම්<br>(5 : 1 බැගින් රු. 20 ප්‍රතිෂ්ඨාවට සංචිත ප්‍රාග්ධනීත කිරීම) | 4,000 | 4,000 |
| ආ) | මුදල් ගිණුම (හර)<br>සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රා. ගිණුම<br>(4 : 1 බැගින් රු. 10 හිමිකම් නිකුතුවක් සිදු කිරීම) | 2,500 | 2,500 |
| ඉ) | මුදල් (හර)<br>සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම<br>(රු. 20 බැගින් ස.කො. 50,000 නිකුත් කිරීම) | 1,000 | 1,000 |
| (iv) අ) | රඳවාගත් ඉපයුම් ගිණුම (හර)<br>සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම<br>(රු. 500 පොදු සංචිතයට මාරු කිරීම) | 500 | 500 |
| ආ) | රඳවාගත් ඉපයුම් (හර)<br>මුදල්<br>(කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ 200) | 200 | 200 |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස 02**

සීමිත ජයමග පොදු සමාගමේ 2019.03.31 දිනට පහත ශේෂයන් ඔබට දී ඇත.

| | රු. |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 500,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 50,000 |
| පොදු සංචිතය | 140,000 |
| රඳවාගත් ඉපයුම් | 120,000 |

2020.03.31 අවසන් වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

- 2020.03.31 අවසන් වර්ෂය සඳහා බදු අඩුකළ පසු කාලච්ඡේදයේ ලාභය 420,000 කි.
- ව්‍යාපාරය සතු ගොඩනැගිල්ල ප්‍රථම වරට ප්‍රත්‍යාගණය කර ඇති අතර එහි අගය වැඩිවීම
- රු. 100,000 කි. මෙය ගිණුම්වලට ගැනීමට තීරණය කර ඇත.
- සාමාන්‍ය කොටස් 20,000 ක් රු. 10 බැගින් නිකුත් කිරීම.
- 2020.03.31 දිනට, එනම් කාලච්ඡේදය අවසානයේ පවතින සෑම සාමාන්‍ය කොටස් 7 : 1 බැගින් සංචිත ප්‍රාග්ධනීත කිරීම. මේ සඳහා ප්‍රත්‍යාගණන සංචිතය භාවිත කිරීම.
- අධ්‍යක්ෂක මණ්ඩලය පහත තීරණ ගෙන ඇත.
  - පොදු සංචිතයට රු. 40,000 මාරු කිරීම.
  - සාමාන්‍ය කොටස් සඳහා රු. 20,000 ගෙවා ඇති අතර රු. 30,000 ක ලාභාංශ යෝජනා කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

1) සීමිත ජයමග පොදු සමාගමේ 2020.03.31 අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය.

**සීමිත ජයමග පොදු සමාගම**
**2020.03.31 න් අවසන් වසර සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

රු. '000

| | සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිත | පොදු සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 500 | 50 | 140 | 120 | 810 |
| මුළු විස්තීර්ණ ආදායම් | | 100 | | 420 | 520 |
| කොටස් නිකුතුව | 200 | | | | 200 |
| සංචිත ප්‍රාග්ධනීත කිරීම් | 100 | (100) | | | - |
| පොදු සංචිතයට මාරු කිරීම | | | 40 | (40) | - |
| ගෙවූ ලාභාංශ - සාමාන්‍ය කොටස් | | | | (20) | (20) |
| යෝජිත ලාභාංශ - සාමාන්‍ය කොටස් | | | | (සටහන) | |
| | 800 | 50 | 140 | 480 | 1,510 |

- සටහන : සාමාන්‍ය කොටස් සඳහා රු. 30,000 ලාභාංශයක් යෝජනා කර ඇත.


Copyright © www.e-thaksalawa.moe.gov.lk